# ආරක්ෂිත කර්මාන්තශාලා ඉදිකිරීම සහ පවත්වාගෙන යාම සඳහා සන්නාමයන් වගකීම ගැනීම : රානා ප්ලාසා ඛේදවාචකයේ වින්දිතයන් සිහිකිරීමේ සත්වන වර්ෂ පූර්ණය සහ ගෝලීය ඇඟළුම් කර්මාන්තය වෙනස් කිරීම සඳහා කැපවීම

අප්‍රේල් 24, 2020 බංගලාදේශයේ රානා ප්ලාසා ගොඩනැගිල්ල බිඳ වැටී 1134 ශ්‍රමිකයින් මරණයට පත්කර 2500කට වැඩි ප්‍රමාණයක් අනතුරට පත් වී වසර 7ක් ගතවී ඇත. එය මෑත ඉතිහාසයේ සිදුවූ මරණීය කාර්මික අනතුරු වලින් එකකි. වර්තමාන කොවිඩ් - 19 වසංගතය හමුවේ, ගෝලීයකරණය පිළිබඳ නැවත සිතා බලන කළ, රානා ප්ලාසාව ඉතා වැදගත් සංසිද්ධියක් වන අතර ඉගෙනීම් රැසක් එය දරා සිටී.

රානා ප්ලාසා ඛේදවාචකය, ලෝකයේ කීර්තිමත් සන්නාම සඳහා ඇඟළුම් නිපදවන ශ්‍රමිකයන්ගේ දුර්ජනක සහ ඔවුන්ට වැඩකිරීමට ඇති අප්‍රෘෂ්ට තත්වයන් නිරාවරණය කළ අවස්ථාවකි. මෙම සංකීර්ණයේ විවිධ කර්මාන්තශාලා තුල සන්නාම 30 සඳහා නිපදවීම සිදුවී ඇත. මෙම විනාශය වළක්වා ගත හැකි තත්වයක් පැවති ඇත්තේ එම ගොඩනැගිල්ලේ තත්වය පිළිබඳ සේවකයින් කාරණා සැළකිරීම නිසාවෙනි. එහෙත් ඔවුන්ට බලහත්කාරයෙන් හෝ රැකියා අහිමිවීමේ අවධානම නිසා සේවය සඳහා යෙදී ඇත.

මෙම සුවිශාල මිනිස් ඛේදවාචය මහජන විරෝධය ඇතිකළ අතර එය නිසා ප්‍රතිඵලයක් ලෙස ගිනි සහ ගොඩනැගිලි සුරක්ෂිතතාව පිළිබඳ අනුමැතිය බිහිවිය. එම අනුමැතිය මගින් සන්නාම, වෙළෙන්දන් සහ වෘත්තිය සමිති නීතිමය වශයෙන් ගිනි සහ ආරක්ෂිත තත්ව ඇගළුම් කර්මාන්තශාලා තුළ බලාත්මක කිරීම සඳහා බැඳී ඇතිබව තහවුරු කරයි. එය යටතේ කර්මාන්තශාලා පරීක්ෂාව අනිවාර්ය අතර ලබාගන්නා දත්ත සහ ගන්නා ලද ප්‍රතිකර්මීය උපාය මහජනයාට විවෘතව තැබිය යුතුය. එමගින් එහි විවෘත භාවය සනාථවන අතර සන්නාම සැපයුම් කර්මාන්තශාලාවල ආරක්ෂිතභාවය සඳහා වගවීම ඇතිකල හැක. මෙම තත්ව සඳහා අනුකූල නොවන සැපයුම්කරුවගේ වෙළඳ ගිවිසුම් නැවතීමේ අවධානමක් පවතී. එසේම මෙම අනුමැතිය තව දුරටත් පුළුල් වූ ක්‍රියාදාම ගොඩනැගීම තුළින් රැකියා ස්ථානයේ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳව සේවකයින් ඇති දුක්ගැනවිලි සෘජුව ප්‍රකාශකිරීම සඳහා අවස්ථාව ලැබී ඇත. එම නිසා ආරක්ෂා රහිත කාර්ය ප්‍රතික්ෂේප කිරීම සඳහා අයිතිය තහවුරු කර ඇති අතර එය ශිෂ්ටීය වැඩකිරීමේ අයිතිය තහවුරු කිරීමේ එක් පියවරකි.

## ශ්‍රමිකයින් මනුෂ්‍යයින් වන අතර ඔවුන් ඉවත දැමිය හැකි ශරීර නොවේ

රානා ප්ලාසා ඛේදවාචකය මගින් පෙන්නුම් කරන ව්‍යුහාත්මක බිඳවැටීම ගෝලීය සැපයුම් පද්ධතියේ පවතින ව්‍යුහාත්මක විෂමතාවය තුළ පවතින්නක් වන අතර එය මෙම විනාශයේ මූල්‍ය වේ. රානා ප්ලාසාව ඇගළුම් හෝ වේගවත් විලාසිතා කර්මාන්තයේ බැරෑරුම් ඛේදවාචක ගොන්නට එකතුවන අතර එය ගෝලීය සැපයුම් පද්ධතිය පවත්වාගෙන යන අසමානතා වල නිරූපණයකි. මෙම සිද්ධිය වසර සියයකට පෙර 145 සේවකයින් මියගිය නිව්යෝක් නගරයේ ට්‍රයිඇන්ගල් ෂර්ට් වෙස්ට් කර්මාන්තශාලා සිද්ධියට සමානකම් දක්වයි. එසේම 2020 දී සේවකයින් 7 මියගිය ගුජරාටයේ නන්දාන් ඩෙනිම් කර්මාන්තශාලා ගින්නටද සමාන වේ. කර්මාන්තශාලා ගිනිගැනීම් සහ මරණ ඇගළුම් කර්මාන්තය තුල තවදුරටත් පවතින අතර එය සුලභ වී ඇත්තේ සේවකයින් මනුෂ්‍යයන් ලෙස නොව ඉවත දැමිය හැකි ශරීර ලෙස සලකන බැවිනි. වේගවත් විලාසිතා කර්මාන්තය තුල සන්නාම සහ වෙළඳුන් ආරක්ෂිත කර්මාන්තශාලා සහ පරිසරයක් සඳහා ආයෝජයෙන් වැළකී සිටින්නේ එමඟින් නිෂ්පාදන පිරිවැය වැඩිවන නිසාවෙනි. එම නිසා නීතිමය තත්ව මගින් නියාමනය සහ දැඩි

බලාත්මක කිරීම් අවශ්‍ය වේ. සන්නාම සඳහා වැඩිවන ආදායම් නොනැසී පවත්වාගෙන යාම සඳහා සේවකයන්ගේ ජීවිත අවධානමකට හෙලා ඇත.

ගෝලීය ඇඟළුම් කර්මාන්තයේ විශාල සහ අසාධාරණ මිල තරඟයක් පවතින අතර එම නිසා දරිද්‍ර මට්ටමේ වැටුප් ගෙවීම්, කාන්තා කම්කරුවන්ගේ ශ්‍රම සූරාකෑම, ජාතික සහ අන්තර්ජාතික තත්වයන් නොසලකා හැරීම සිදුවේ. එම නිසා ගෝලීය නිෂ්පාදන දාමයේ සැබෑ ගෙවීම් කිරීමට සන්නාම අසමත් වී ඇත. සන්නාම ඔවුන්ගේ ගෝලීය සැපයුම් දාමය සිදුවූ වියදම් නොසළකා හරින අතරම සැපයුම් කරුවන්ගෙන් ඉතා පහළ මිලකට සැපයුම් දෙන ලෙස බලකර සිටී. එමනිසා එහි බර සේවකයින් මත පැටවෙන අතර ඔවුන්ට මූලික රැකියා ස්ථාන සුරක්ෂිතභාවය සහ සෞඛ්‍ය පහසුකම් රහිත තත්වවල සේවය කිරීමට බලකර ඇත.

## එකඟතා රාමුව සියළු ඇඟළුම් නිෂ්පාදන රටවල් සඳහා පුළුල් කිරීම

වර්තමාන ගෝලීය සැපයුම් පද්ධතිය සේවකයින්ගේ ජීවිත සහ සෞඛ්‍ය ආරක්‍ෂා කිරීම සඳහා ආරක්ෂිත කර්මාන්තශාලා ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් ආයෝජනයන් කර නැත. මෙයට නව ලිබරල්වාදය මගින් සහය දක්වන්නේ එය දියුණුවෙමින් පවතින රටවල සාමාජීය යටිතල පහසුකම් සඳහා වූ අරමුදල් කප්පාදු කිරීමට බලකර සිටින බැවිනි. එසේ පහසුකම් කප්පාදු කිරීම වැඩකරන දුගී ජනතාවට අසමාන ලෙස බලපෑම් ඇතිකරයි.වෘත්තීය සමිතිකරණය ව්‍යූහාත්මකව ඉවත් කර ඇති බැවින් සේවකයින් සඳහා ඔවුන්ගේ අයිතීන් දිනාගැනීමට ආයතනික ක්‍රියාදාමයක් නොමැති වේ; එනමුත්, ඉතිහාසය අපට නැවතත් කියාදෙන පරිදි වෘත්තීය සමිති යනු ගෝලීය ප්‍රාග්ධනය සහ ශ්‍රමය අතර ඇති බල අසමතුලිතතාවය සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් බවය.

කොවිඩ් - 19 වසංගතය මෙම අර්බුධය තවත් උද්දීපනය කර ඇත. සේවකයින් තවත් අමානුෂික සහ දරිද්‍ර තත්වයේ වැඩකරන අතර ඔවුන් රෝගී වීම්, කුසගින්න සහ නිවාස අහිමිවීම් තුල ගිලී යමින් සිටී. ඇඟළුම් නිෂ්පාදන කරණ රටවල සාමාජීය ආරක්‍ෂණ දැල ගෝලීය නව - ලිබරල්වාදය සහ එහි බලහත්කාරී ව්‍යූහාත්මක වෙනස්කම් කිරීමේ වැඩසටහන් යටතේ නැතිවී ගොස් ඇති නිසා ප්‍රමාණවත් ප්‍රජා සෞඛ්‍ය සහ සාමාජීය යටිතල පහසුකම් රහිත වී තිබේ. සෞඛ්‍ය සඳහා සාමාජීය නිර්ණායක ඉවතලන පද්ධතියක් තුල සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය, මිලදී ගැනීමේ හැකියාව මත රැඳී පවතී. එමගින් නව ආකාරයේ විෂමතා ගොඩනගිමින් පවතී.

මෙම අතිශයින් ව්‍යාකුල තත්වයන් තුල, සන්නාමයන් ඔවුන්ගේ බිලියන ගණනක් වූ ලාභය තුලින් සේවකයින්ගේ යහපත් පැවැත්ම සහ ආරක්‍ෂිත රැකියා තත්ව සඳහා වගවීම අත්‍යාවශ්‍ය වේ. වර්තමානය මිලියන ගණනක් සේවකයින්ගේ ජීවිත ඉවතලා කටයුතු කරන ව්‍යූහයක් සඳහා කාලය නොවන අතරම ලාභය පුද්ගලීකරණය සහ අලාභය සාමාජීයකරණය කරන එවැනි ව්‍යූහයක කාලය නොවේය. බංගලාදේශයේ අනුමැතිය කම්කරු ව්‍යාපාරය සඳහා පාඩම් ලබාදෙන අතර එය ප්‍රධාන ව්‍යාපාර නිත්‍යානුකූලව බැඳීමට සහ ව්‍යාපාර සඳහා ප්‍රසිද්ධියේ අභියෝග කර ඇත. මෙම අනුමැතිය මගින කරන ලද දිනාගැනීම් තව දුරටත් පුළුල් කර යහපත් වැඩකරන තත්වයන් සැපයුම් දාමය පුරාද, ජීවන ආදායම සහ වෘත්තිය සමිති ඇතිකිරීම ආදී කම්කරු ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාගැනීමට කටයුතු කළ යුතුය.